# සාර්ථක ඕකිඩ් වගාවකට........

ඕකිඩ් ශාකය ඕකිඩේසියේ (Orchidaceae) කුලයට අයත් බහුවාර්ෂික, ඒක බීජ පත්‍රී පැලෑටියකි. විවිධ ඕකිඩ් ගණ (Genera) 800 කට අධික සංඛ්‍යාවක් ලොව පුරා විවිධ ස්වාභාවික පරිසර තත්ත්ව යටතේ දක්නට ලැබේ. විවිධ වර්ණයන්ගෙන් යුතු අලංකාර පුෂ්ප හටගැනීම, විවිධ පරිසර තත්ත්වයන් යටතේ වගා කළ හැකි වීම සහ පුෂ්ප දිගු කාලයක් තබා ගැනීමට හැකිවීම නිසා ඕකිඩ් ශාකය කැපූ මල් වගාවේ දී සුවිශේෂී ස්ථානයක් හිමිකර ගනී. ඕකිඩ් වගාව වර්තමානයේ දී මෙරට තුළ ස්වයං රැකියාවක් ලෙස මෙන්ම ව්‍යාපාරයක් ලෙස ද, ඉතා සාර්ථකව සිදු කළ හැකි වූවකි. ඕකිඩ් සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳ පොළෙහි ද ඉහළ ඉල්ලුමක් පවතින බැවින් ඕකිඩ් වගාව විදේශ විනිමය උපයා ගැනීමේ ඉතා හොඳ මාර්ගයක්ව පවතී.

## අවශ්‍ය දේශගුණික සාධක

- මුහුදු මට්ටමේ සිට අඩි 1500 දක්වා උස තෙත් කලාපීය ප්‍රදේශ වල ඩෙන්ඩ්‍රෝබියම් වර්ගයේ ඕකිඩ් වගා කල හැකිය. පහත රට තෙත් කලාපීය ප්‍රදේශ හා පොල් ත්‍රිකෝණයට අයත් ප්‍රදේශ ඕකිඩ් වගාව සඳහා සුදුසු වේ.
- ප්‍රශස්ත උෂ්ණත්වය $25^{0}$ C - $30^{0}$ C
- ප්‍රශස්ත සාපේක්ෂ ආර්ද්‍රතාවය 75% - 80%
- ආලෝකය - 50% හෝ සෙවන 50% සෙවන වැඩි තත්ත්ව යටතේ වසරකට ඇතිවන මල් කිනිති ගණන අඩු වේ.

## රෝපන ද්‍රව්‍ය

උසස් තත්ත්වයේ ඕකිඩ් වගාවක් පවත්වා ගැනීමට ඉතා හොඳ නිරෝගී පැළ භාවිතා කිරීම අත්‍යාවශ්‍යය. රෝපන ද්‍රව්‍ය ක්‍රම කිහිපයකින් සපයා ගැනීමේ හැකියාව පවතී.

### වර්ධක ප්‍රචාරණය

i. **බෙදීම** : මෙහි දී අවම වශයෙන් අංකුර 03 ක් අයත් වන සේ ප්‍රධාන කඳෙන් කොටස් බෙදා වෙන් කර ගනු ලැබේ.

ii. **වායව අංකුර**

iii. **පසු බල්බ (ව්‍යාජ බල්බ):** පත්‍ර රහිත අවස්ථාවේ පසු බල්බ වැලි බඳුනක සිටුවීමෙන් ස්ථාන කිහිපයකින් අළුත් පැළ හට ගනී.

### බීජ මඟින් පැළ ලබාගැනීම

රෝපන ද්‍රව්‍ය ලබාගැනීමට බීජ භාවිතා කිරීම බහුලව සිදු වේ. කෘත්‍රිමව පරාගනය සිදුකිරීමෙන් බීජ ලබාගනී. හොඳින් මේරූ බීජ විද්‍යාගාරයක දී කෘත්‍රිම රෝපන මාධ්‍යයක වගා කිරීම සිදුකර යි. ඇතිවන කුඩා පැළ සමූහ පෝච්චි (Compots) තුල රෝපනය කිරීම මඟින් සාමාන්‍ය පරිසර තත්ත්ව යටතේ වගා කිරීමට සුදුසු ප්‍රමාණයෙන් විශාල, හොඳින් වැඩුණු, නිරෝගී පැල ලබා ගත හැකි වේ. නව ඕකිඩ් ප්‍රභේද බිහි කිරීම සඳහා බීජ පැළ බහුලව භාවිතා කරනු ලබයි.

### පටක රෝපනය :

අපනයනය සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් වන සර්වසම පැළ ගහනයක් පවත්වා ගැනීම සඳහා ඉතා හොඳ ක්‍රමයකි. පටක රෝපනයෙන් ලබාගන්නා උසස් ප්‍රභේද වල පැළ භාවිතා කරමින් වගාව ඇරඹීම විදේශ වෙළඳපොල සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් වේ.

වර්ධක ප්‍රචාරණ ක්‍රම, බීජ හා පටක රෝපනය මඟින් ඕකිඩ් වගාව සඳහා පැළ සකස් කර ගැනීමේ හැකියාව පවතී.

## රෝපන මාධ්‍යය

අපිශාකී ඕකිඩ් වර්ග වගා කිරීමේ දී සංධාරණය සඳහා පමණක් රෝපන මාධ්‍යය සැපයිය යුතු වේ. මේ සඳහා අඟල් 1/2, 3/4 හා 1 ප්‍රමාණයේ දැව අඟුරු භාවිතා කළ හැකිය. අඹ වැනි මෘදු දැව වර්ගයක අඟුරු ඉතා උචිතය. සමහර අවස්ථා වලදී උළුකැට කැබලි හෝ කුඩා පොල් ලෙලි කැබලි අඟුරු සමඟ මිශ්‍ර කර රෝපන මාධ්‍ය ලෙස යොදා ගැනීමට හැකි වේ. රෝපන මාධ්‍ය ලෙස පස් හෝ ගඩොල් කැබලි භාවිතා කිරීම නුසුදුසු වූවකි.

## රෝපන බඳුන්

මැටි, සිමෙන්ති හෝ ප්ලාස්ටික් දැල් බඳුන් ඕකිඩ් වගාවේ දී රෝපන බඳුන් ලෙස භාවිතා කිරීමේ හැකියාව පවතී. යොදාගන්නා බඳුන් හොඳින් සවිවර විය යුතුය. භාවිතා කරන බඳුන්වල විශාලත්වය ඕකිඩ් ශාකයේ වර්ධන අවස්ථාවට අනුව වෙනස් වේ. වගාව සඳහා මැටි බඳුන් යොදා ගැනීම වඩා යෝග්‍ය වේ.

## ඕකිඩ් පැළ බඳුන් තුළ සිටුවීම

- බීජ මඟින් ලබාගන්නා පැළ කුඩා අවධියේ දී සාමූහික බඳුන් තුළ රෝපනය කරනු ලැබේ. මේ සඳහා බඳුන් මිශ්‍රනය ලෙස වැලි, කුඩා අඟුරු කැබලි, කුඩා උළුකැට කැබලි සහ කොහුබත් සමාන ප්‍රමාණයන් මිශ්‍ර කිරීමෙන් සාදාගනු ලැබේ. වගා මාධ්‍ය ජීවාණුහරණය කරගත යුතු අතර එක් සාමූහික බඳුනක් තුළ කුඩා පැළ 25 ක් පමණ සිටුවිය හැකි වේ.

**රුචිනි විදානපතිරණ**
*පර්යේෂණ නිලධාරිණී*
**අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය,**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය.**

- සාමූහික බඳුන් තුල අඟල් 2-3 ක් වැඩුනු ශාක ප්‍රවේශමෙන් වෙන් කරගත යුතුය. මියගිය පත්‍ර ආදිය ඇත්නම් ඒවා ඉවත්කර කැප්ටාන් වැනි දිලීර නාශකයක විනාඩි 2-3 ක් පමණ කාලයක් පැළ සම්පූර්ණයෙන් ගිල්වා තබන්න. ඉන්පසු එම පැළ අඟල් 2 ප්‍රමාණයේ බඳුන්වල සිටුවන්න. මාධ්‍ය ලෙස අඟල් 1/2 හා 3/4 ප්‍රමාණයේ දැව අඟුරු යොදා ගත හැකිය.

- අඟල් 2 ප්‍රමාණයේ බඳුන්වල අඟල් 6 ක් පමණ වර්ධනය වූ පසු පැළ විශාල බඳුන් වලට මාරු කළ හැක. මෙම බඳුන් අඟල් 5 පමණ විශාල විය යුතු වේ. වගා මාධ්‍ය ලෙස අඟල් 1, 1/2, හා අඟල් 3/4 ප්‍රමාණයේ දැව අඟුරු භාවිතා කිරීමේ හැකියාව පවතී.

- මෙහි දී, පළමුවෙන්ම උළුකැට කැබලි දෙකක ආධාරයෙන් අඟල් 9 ක් පමණ උස ලී ආධාරකයක් බඳුනේ සවි කරගත යුතුය. ආධාරකය රෝපන බඳුනේ පැති බිත්තියට ආසන්න වන සේ සවි වීම වැදගත් ය. ලොකු ප්‍රමාණයේ අඟුරු කැබලි බඳුනේ ඉහළට වන සේ වගා මාධ්‍ය බඳුනේ අසුරාගත යුතු වේ. අඟල් 2 ප්‍රමාණයේ බඳුන් වලින් ප්‍රවේශමෙන් ඉවත් කරගත් පැළ පිරිසිදු කර දිලීර නාශකයක ගිල්වා විනාඩි 2-3 ක් තබන්න. ඉන්පසු, පැළයේ වර්ධක අග්‍රය රෝපන බඳුනේ කේන්ද්‍රය දෙසට යොමු වන සේ ආධාරකයට තබා නොසෙල්වෙන සේ ගැට ගසා ගන්න.

- බඳුන තුළ පැළ සිටුවීමෙන් පසු එම බඳුන් කොන්ක්‍රීට් හෝ ලී දඬු වලින් සාදාගන්නා ලද ආධාරක මේස මත හොඳින් අසුරා ගත යුතු වේ. මේස සකසා ගැනීම සඳහා අඟල් 2 ප්‍රමාණයේ කම්බි දැල් යොදා ගැනීම සුදුසු ය.

- ඕකිඩ් වගාවක් ආරම්භ කිරීමේ දී සාමාන්‍යයෙන් රෝපන ද්‍රව්‍ය ලෙස සාමූහික බඳුන් තුළ හොඳින් වර්ධනය වූ පැළ හෝ කුඩා ප්‍රමාණයේ (අඟල් 2) බඳුන් තුළ සිටුවා ඇති පැල හෝ මිල දී ගත හැකිය. එවිට ශාකයේ වර්ධන අවස්ථාව අනුව නව බඳුන් වලට මාරු කිරීම කළ හැකි වේ.

## ජලය යෙදීම

ඕකිඩ් සඳහා දිනකට වරක් උදය කාලයේ දී ජලය යෙදිය යුතුය. වියලි කාල වල දී මෙය දිනකට දෙවරක් දක්වා වැඩි කිරීම අවශ්‍යය. රාත්‍රී කාලයේ දී ශාකයේ පාදියට ජලය රැස්වන සේ ජලය යෙදීම නොකළ යුතුය. එම නිසා, සාමාන්‍යයෙන් සවස 2-3 පසු ජලය යෙදීම සුදුසු නොවේ. රාත්‍රී කාලයේ දී මධ්‍යයේ ජලය රැඳී තිබීම මඟින් රෝග වැළදීමේ ප්‍රවණතාව වැඩි වේ. වැසි කාලයේ ජලය යෙදීමේදී වඩා සැලකිලිමත් විය යුතුය. ක්ලෝරීන් සහිත ජලය වගාව සඳහා නුසුදුසුය. නල ජලය යොදාගන්නේ නම් පැය 24 ක කාලයක් විවෘත ටැංකියක රැස්කර තබා ඉන්පසු ශාක වලට යෙදීම සුදුසු වේ.

වියලි කලාපයේ හෝ අඩු ආර්ද්‍රතාවය ඇති ප්‍රදේශවල ඕකිඩ් වගා කිරීමේ දී බිම තෙත් කිරීම මඟින් ආර්ද්‍රතාවය වැඩි කිරීම කළ යුතුය.

# පොහොර යෙදීම

කාබනික හා අකාබනික පොහොර දෙවර්ගයම ඕකිඩ් වගාවේ දී දියර පොහොර වශයෙන් යෙදිය යුතු වේ.

- සාමූහික පෝච්චි හෝ කුඩා පැළවල වර්ධනය වැඩි කිරීම සඳහා N වැඩි N:P:K 20 : 10 : 10 වැනි අකාබනික දියර පොහොර වර්ගයක් යෙදිය හැකිය.

- මධ්‍යම වර්ධන අවස්ථාවේ ඇති පැළ සඳහා 20:20:20 වැනි N:P:K සමව අඩංගු කාබනික දියර පොහොරක් යෙදීමට ප්‍රළුවන.

- මල් ඇතිවන අවස්ථාවේ දී වඩා වැඩි මල් ප්‍රමාණයක් ලබාගැනීම සඳහා N:P:K 13:27:27 වැනි K වැඩි අකාබනික දියර පොහොර වර්ගයක් සුදුසු ය.

- ශාකයක් නව රෝපන බඳුනකට මාරු කරන විට ඉක්මනින් හොඳ මූල පද්ධතියක් ලබාගැනීම සඳහා සති 02 ක් පමණ යනතුරු N:P:K 10:52:10 වැනි P වැඩි අකාබනික දියර පොහොර වර්ගයක් යෙදිය යුතුය.

(N - නයිට්‍රජන්, P- පොස්පරස්, K - පොටෑසියම්)

# සෙවන සැපයීම

ස්වාභාවික සෙවන, ඕකිඩ් වගාව සඳහා සුදුසු නොවේ. සෙවන ලබාදීම සඳහා කළු පැහැති දැල් (Black Net) යොදා ගනු ලැබේ. ඕකිඩ් වගාවක් අවම වශයෙන් වසර 05 ක් පමණ පවත්වා ගත හැකි බැවින් හොඳින් සකසාගත් කල් පවතින දැල් ආවරණයක් තිබීම අත්‍යාවශ්‍ය වේ. මේ සඳහා 50% පමණ සෙවන ලබාගත හැකි කළු පැහැති දැල් යොදාගනී. එහෙත් කුඩා පැළ අවධියේ දී පමණක් 60% පමණ සෙවන ලබාදීම කළ යුතුය. ඒ සඳහා දැලට උඩින් පොලිතින් ආවරණයක් යොදා ගනී. එමඟින් කුඩා පැල වර්ෂාවෙන් ආරක්ෂා වීම ද සිදු වේ.

නියමිත ප්‍රමාණයට වඩා සෙවන වැඩි වූ විට වසරකට ඇති වන මල් කිනිති සංඛ්‍යාව අඩුවන අතර සෙවන අඩුවීම මල් හා පත්‍ර දැඩි හිරු රැස් නිසා පිළිස්සීමට හේතු වේ. එවිට ගුණාත්මයෙන් අඩු මල් ඇතිවිය හැකිය.

# රෝග හා පලිබෝධ පාලනය

ඕකිඩ් යනු අඩු වර්ධන වේගයක් සහිත ශාකයක් නිසා රෝග හා පලිබෝධ නිසා හානියක් වූ පසු යලි යථා තත්ත්වයට පත්වීමට වැඩි කාලයක් ගත වේ. එමඟින් ආර්ථිකව වැඩි හානියක් සිදු වන අතර සාමාන්‍යයෙන් අනෙකුත් ශාක වලට වඩා රෝග හා පලිබෝධ හානි සඳහා නැඹුරුතාව වැඩිය. එම නිසා ඕකිඩ් වගාවේ දී රෝග පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීමට වගා කරුවන්ට සිදු වේ.

# දිලීර රෝග

## i අග්‍රස්ථය කුණුවීම (Crown Rot)

බහුලව දැකිය හැකි රෝගයකි. ශාකයේ අග්‍රස්ථ අංකුරය කුණුවීම මෙහි දී සිදු වේ. කළු දුඹුරු පැහැති මැරී ගිය අග්‍රස්ථ අංකුරය අවසානයේ දී දක්නට ලැබේ. රෝග ලක්ෂණ ඇති වන විට ශාකයට සම්පූර්ණයෙන් හානි සිදු වී අවසන් බැවින් රෝගය ඇතිවීමට ප්‍රථම එය වලක්වා ගත යුතු වේ.

### රෝග පාලනය

කුඩා පැල වර්ෂාවෙන් ආරක්ෂා කර ගැනීම, හානි වූ පැළ නිරෝගී පැළ වලින් වෙන් කිරීම හා මනා ජල පාලනය, රෝග පාලනය සඳහා ඉතා වැදගත්ය. රෝගී කොටස් ගලවා පුළුස්සා දැමීම ද අවශ්‍ය අවස්ථාවන්හි දී කැප්ටාන් හෝ කාබොක්සින් වැනි දිලීර නාශකයක් යෙදීම ද කළ හැකිය.

## ii. දියමලන් කැම (Damping Off)

මෙම රෝගය සාමූහික බඳුන් තුල දී බහුලව දැකිය හැක. කුඩා ඕකිඩ් පැල වල පාදස්ථ කොටසට හානි සිදු වේ.

## රෝග පාලනය

අධික තෙතමනය රෝගය ඇති වීමට ප්‍රධාන හේතුව නිසා මනා ජල පාලනය. රෝගය මර්ධනයට ඉතා වැදගත් වේ. රෝගී පැල ගලවා පුළුස්සා දැමීමත්. එම බඳුන් නිරෝගී පැළ සහිත බඳුන් වලින් වෙන් කර තැබීමත්. සිදුකළ යුතුය. රෝගය ඇති වූ බඳුන් වලට ජලය යෙදීම තාවකාලිකව නවතා කැප්ටාන් වැනි දිලීර නාශකයක් යෙදීම සුදුසු වේ.

### iii පයිටොප්තෙරා මෘදු කුණු වීමෙ රෝගය (Phytopthera Black Rot)

ප්‍රධාන වශයෙන් පත්‍ර,ව්‍යාජ බල්බ හා මුල්වල රෝග ලක්ෂණ ඇති වේ. පත්‍ර වල ඇති වන ලප තෙත් ස්වභාවයක් ගනී. පසුව එම ලප වියලි කළු පැහැ ගැන් වේ. රෝග ලක්ෂණ ඉක්මනින් ශාකයේ පාදය තෙක් පැතිරී යාම සිදු වේ.

## රෝග පාලනය

මනා ජල පාලනය රෝග මර්දනයට ඉතා වැදගත් වේ. මෙටලැක්සිල් අඩංගු දිලීර නාශකයක් යෙදීමෙන් ද රෝගය පාලනය කිරීමේ හැකියාව ලැබේ.

### iv. පත්‍රවල කහ පැහැති පුල්ලි ඇතිවීම. (Leaf Yellow Blotch)

පරිණත පත්‍ර වල ඉහළ පෘෂ්ඨයේ කහ පැහැති පැල්ලම් ලෙස රෝග ලක්ෂණ ඇති වේ. සමහරවිට පත්‍රයේ යටි පැත්තේ තද කළු දුඹුරු බීජානු දැකිය හැකිය. පත්‍රය සම්පූර්ණයෙන්ම කහ පැහැ වී අවසානයේ ශාකයෙන් හැලී යයි. වර්ෂා කාලයේ දී හානියට ලක් වී වියළි කාලයේ දී පත්‍ර හැලී යාම බොහෝ විට දැකිය හැක.

## රෝග පාලනය

හානි වූ පත්‍ර කපා පුළුස්සා දැවීම. මැන්කොසෙබ්. රිඩොමිල් අඩංගු දිලීර නාශකයක් යෙදීම කළ හැකිය.

### v. පත්‍ර පුල්ලි රෝගය

පත්‍රයේ මතුපිට පෘෂ්ඨයේ තද කළු දුඹුරු පැහැති පුල්ලි ඇති වේ. මෙම ලක්ෂණ සමහර විට පත්‍රයේ පෘෂ්ඨ දෙකෙහිම ඇතිවිය හැකිය.

## රෝග පාලනය

කැප්ටාන් වැනි දිලීර නාශකයක් යෙදිය හැක.

### vi. ඕකිඩ් මලකඩ පුල්ලි රෝගය (Flower Rusty Spots)

මල් පෙති මත කුඩා රතු දුඹුරු පැහැති ලප ඇතිවීම රෝග ලක්ෂණයකි.

## රෝග පාලනය

දිලීර නාශකයක් යෙදීමෙන් පහසුවෙන් මර්දනය කිරීමෙ හැකියාව පවතී.

# බැක්ටීරියා රෝග

### බැක්ටීරියා මෘදු කුණු වීමෙ රෝගය (Bacterial Rot)

තෙත් මතුපිටක් සහිත දුඹුරු පැහැති ගිළුණු ලප පත්‍ර මත ඇති වේ. මෙම ලක්ෂණ සීඝ්‍රයෙන් පත්‍රය පුරා පැතිරී යයි.

## රෝග පාලනය

සියළුම රෝගී පත්‍ර කපා ඉවත් කිරීමත්. රෝගය තදින් පැතිරී ඇත්නම් එම ශාක ගලවා පුළුස්සා දැමීමත් කළ හැකිය. ස්ට්‍රෙප්ටොමයිසින් සල්ෆේට් වැනි බැක්ටීරියා නාශකයක් යෙදීමෙන් ද රෝගය පාලනය වේ.

# වෛරස් රෝග

රෝග ලක්ෂණ බොහෝ විට පත්‍ර ආශ්‍රිතව ඇති වේ. පත්‍ර විචිත්‍ර රෝගය ප්‍රධාන වශයෙන් වැළදෙන වෛරස් රෝගයයි. මෙහි දී තද හා ලා කහ පැහැති සිහින් ඉරි පත්‍රය පුරා තැනින් තැන ඇති වේ.

## රෝග පාලනය

රෝගී ශාක ගලවා පුළුස්සා දැමිය යුතු වේ. රෝගය පැතිරීම කෘමීන් මඟින් හා මල් නෙලීමට භාවිතා කරන උපකරණ මඟින් සිදුවන නිසා යුෂ උරා බොන කෘමීන් මර්ධනය හා ජීවාණුහරණය කරගත් උපකරණ මල් කැපීම සඳහා භාවිතා කිරීම වැදගත් වේ.